# උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා පළාත් භාෂා පරිවර්තන සේවයට අයත් පරිවර්තක තනතුරේ II වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2018

උතුරු පළාත් රාජ්‍ය සේවයේ පළාත් භාෂා පරිවර්තන සේවයට **I වන වගුවේ** සඳහන් කර ඇති පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් **2019 ජනවාරි මස වන විට** යාපනයේ දී පැවැත්වීමට නියමිත බව මෙයින් දන්වා සිටිනු ලැබේ. අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනය වනුයේ **26.12.2018** වන දිනයි.

- **පවතින පුරප්පාඩු පිළිබඳ විස්තර මාධ්‍ය වශයෙන් (I වන වගුව)**

| අංකය | භාෂා පරිවර්තක මාධ්‍ය වශයෙන් | මාධ්‍ය අංකය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | **භාෂා** පරිවර්තක (ඉංග්‍රීසි – දෙමළ) | I | 04 |
| 02 | **භාෂා** පරිවර්තක (දෙමළ - සිංහල) | II | 10 |
| 03 | **භාෂා** පරිවර්තක් (ඉංග්‍රීසි - සිංහල) | III | 03 |
| **එකතුව** | | | 17 |

## 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-

02.1 **01.01.2018** වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද පළාත් භාෂා පරිවර්තක තනතුරට අදාල සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා බඳවා ගැනීමේ සැලැස්මේ නිර්දේශිත කොන්දේසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් ප්‍රඥප්තීන් හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක **1817/30** දරණ **2013.07.03** වැනි දින දරණ අති විශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයේ ආයතන කාර්ය පටිපාටිය යනාදීන්ට හා බඳවා ගැනීමේ කාලවකවානුව තුළ සිදු කරනු ලබන කිසියම් සංශෝධනයන්ට ද යටත් කර තෝරා ගන්නා විභාග අපේක්ෂකයන් පරිවර්තන තනතුරේ **II වන ශ්‍රේණියට** පත් කරනු ලැබේ.

02.2 විවෘත තරඟ විභාගය මගින් පත්වීමට තෝරා ගන්නා විභාග අපේක්ෂකයන් පත්වීම භාරගන්නා දින සිට වසර තුනක් (03) පරිවාස කාලයට යටත් කොට පරිවර්තක II වන ශ්‍රේණියට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. එමෙන්ම සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි භාෂා පරිවර්තක II වන ශ්‍රේණියට බඳවා ගත් දින සිට වසර තුනක (03) කාලය තුළ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුයි.

02.3 මෙම සේවා තනතුර ස්ථාන මාරුවීම් වලට යටත් වූ තනතුරකි. එබැවින් මෙම තනතුරට තෝරා ගන්නා අපේක්ෂකයන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුයි යන නියෝගයට යටත් විය යුතුයි.

02.4 එක් සේවා ස්ථානයකට පත්වීම් ලබන අපේක්ෂකයා, අවම වශයෙන් එම සේවා ස්ථානයේ අවුරුදු **පහක් (05)** අඛණ්ඩව සේවය කළ යුතුයි යන නියෝගය අනිවාර්ය නියෝගයකි.

02.5 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අදාළව දිගටම නිකුත් කරනු ලබන චක්‍රලේඛවලට එකඟව පත්වීම් දින සිට **වසර පහක් (05)** අවසන්වීමට ප්‍රථම නියම කර ඇති දෙවන භාෂා ප්‍රවීනතාවය ලබා ගත යුතුයි.

02.6 පත්වීම් ගණන හා පත්වීම ක්‍රියාත්මක වන දිනය යනාදි කරුණු පත්වීම් බලධාරියා විසින් සීමා කරනු ලැබේ. පත්කිරීමට නියමිත සංඛ්‍යාව **I වන වගුවේ** සඳහන් කර ඇති පරිදි වේ. කෙසේ වුව ද දන්වා ඇති පුරප්පාඩු සම්බන්ධයෙන් එම පුරප්පාඩු පූර්ණය කිරීම හෝ නොකර සිටීමේ බලතල පත්වීම් බලධාරියා සතුය.

## 03. වැටුප් පරිමාණය :-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ප්‍රකාර, වැටුප් කාණ්ඩය **MN 6 - 2016** ට අනුව පරිවර්තන තනතුරේ **II වන ශ්‍රේණියට** ඒකාබද්ධ වැටුප් ප්‍රතිශතය වනුයේ **රුපියල් 36,585 – 10 x 660 - 11 x 755 - 15 x 930 – 65,440/-** ය. (රුපියල් 38,565/- ක් වන වැටුප් පියවරට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුයි) කෙසේ වුව ද ඉහත සඳහන් චක්‍රලේඛයේ **II වන වගුවේ** සඳහන් විධිවිධානවලට අනුව වැටුප් ගෙවනු ලැබේ.

**04. සාමාන්‍ය සුදුසුකම් :-**

04.1 අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුයි.

04.2 අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුත් පුද්ගලයෙක් විය යුතු අතර මනා චරිතයකින් යුත් පුද්ගලයෙක් ද විය යුතුයි.

04.3 (අ) අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි. මෙම අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථම අයදුම්කරුගේ පදිංචිය අවුරුදු හයකින් (06) අවම වශයෙන් අවුරුදු (03) ක් උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවෙකු විය යුතුයි.

**හෝ**

(ආ) අයදුම්කරුගේ හෝ දෙමාපියන්ගේ උපන් ස්ථානය උතුරු පළාත් විය යුතු අතර අඩුම වශයෙන් වසර පහක් (05) උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුයි. **(ස්ථිර පදිංචිය සනාථ කිරීමට ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාම සේවා නිලධාරි විසින් ප්‍රදානය කරන හෝ ඡන්ද හිමි නාම ලේඛණයෙන් උපුටා ගන්නා ලද සහතිකයේ පිටපත සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි)**

04.4 අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට හෝ ඊට ප්‍රථම මෙම තනතුර සඳහා කැඳවා ඇති **සියළුම සුදුසුකම්** අයදුම්කරු විසින් සම්පූර්ණ කර තිබිය යුතුයි.

04.5 අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට අයදුම්කරුගේ **වයස අවුරුදු විසි එකට (21) නොඅඩු, අවුරුදු තිස්පහට (35) නොවැඩි** විය යුතුයි.

**05. අධ්‍යාපන සුදුසුකම් :-**

**05.1 භාෂා පරිවර්තක (දෙමළ - ඉංග්‍රීසි) :-**

(1) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් දෙමළ භාෂාව හෝ ඉංග්‍රීසි භාෂාව එක් විෂයක් ලෙස සමත් කර ලබා ගත් උපාධියක් හිමි විය යුතුයි.

**ඒ සමඟම**

(අ) උපාධියට එක් විෂයක් වශයෙන් දෙමළ භාෂාව සමත් වී ඇති අයදුම්කරුවන්, අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් හිමිකර තිබිය යුතුයි **නැතිනම්** උපාධියට ඉංග්‍රීසි භාෂාව එක් විෂයක් වශයෙන් සමත් වී ඇති අයදුම්කරුවන්, අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් දෙමළ භාෂාව/ දෙමළ සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් හිමිකර තිබිය යුතුයි.

**හෝ**

(ආ) උපාධියට එක් විෂයක් වශයෙන් දෙමළ භාෂාව සමත් වී ඇති අයදුම්කරුවන්, අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් හිමිකර තිබිය යුතුයි **හෝ** උපාධියට එක් විෂයක් වශයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වී ඇති අයදුම්කරුවන්, අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් දෙමළ භාෂාවට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් හිමිකර තිබිය යුතුයි.

**හෝ**

(2) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් **භාෂා පරිවර්තන අධ්‍යාපනය** එක් විෂයක් ලෙස සමත් වී උපාධියක් හිමිකර තිබිය යුතුයි.

**ඒ සමඟම**

(අ) අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් හිමිකර තිබිය යුතුයි **ඒ සමඟම** අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් දෙමළ භාෂාව හා සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් හිමිකර තිබිය යුතුයි.

**හෝ**

(ආ) අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් හිමිකර තිබිය යුතුයි ඒ සමඟම අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් දෙමළ භාෂාවට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් හිමිකර තිබිය යුතුයි.

**05.2 භාෂා පරිවර්තක (සිංහල - දෙමළ ) :-**

(1) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්ව විද්‍යාලයකින් දෙමළ භාෂාව හෝ සිංහල භාෂාව එක් විෂයක් ලෙස සමත්වී උපාධියක් හිමිකර තිබිය යුතුයි.

**ඒ සමඟම**

(අ) උපාධියට එක් විෂයක් ලෙස දෙමළ භාෂාව සමත් වී ඇති අයදුම්කරුවන්, අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් සිංහල භාෂාව හා සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් හිමිකර තිබිය යුතුයි **හෝ** උපාධියට එක් විෂයක් ලෙස සිංහල භාෂාව සමත් වී ඇති අයදුම්කරුවන්, අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් දෙමළ භාෂාව හා සාහිත්‍යයට සම්මාන සාමාර්ථය හිමිකර තිබිය යුතුයි.

**හෝ**

(ආ) උපාධියට එක් විෂයක් ලෙස දෙමළ භාෂාව සමත් වී ඇති අයදුම්කරුවන්, අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් සිංහල භාෂාවට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් හිමිකර තිබිය යුතුයි **හෝ** උපාධියට එක් විෂයක්

ලෙස සිංහල භාෂාව සමත් වී ඇති අයදුම්කරුවන්, අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් දෙමළ භාෂාවට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් හිමිකර තිබිය යුතු.

**හෝ**

(2) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්ව විද්‍යාලයකින් **භාෂා පරිවර්තන අධ්‍යාපනය** එක් විෂය මාලාවක් ලෙස සමත් වී උපාධියක් හිමිකර තිබිය යුතුයි.

**ඒ සමඟම**

(අ) අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් සිංහල භාෂාව හා සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් හිමිකර තිබිය යුතුයි ඒ සමඟම අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් දෙමළ භාෂාව හා සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුයි.

**හෝ**

(ආ) අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් සිංහල භාෂාවට අවම වශයනේ සාමාන්‍ය සාමාර්ථයක් හිමිකර තිබිය යුතුයි **ඒ සමඟම** අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් දෙමළ භාෂාවට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් හිමිකර තිබිය යුතුයි.

**හෝ**

(3) ශ්‍රී ලංකාවේ පෙරදිග භාෂා ප්‍රවර්ධන සංගමයේ අවසාන උපාධිය (පණ්ඩිත්) හිමිකර තිබිය යුතුයි.

**ඒ සමඟ**

(අ) අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් හිමිකර තිබිය යුතුයි.

**හෝ**

(ආ) අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් හිමිකර තිබිය යුතුයි.

**05.3 භාෂා පරිවර්තක (සිංහල - ඉංග්‍රීසි) :-**

(1) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්ව විද්‍යාලයකින් සිංහල භාෂාවට හෝ ඉංග්‍රීසි භාෂාව එක් විෂයක් ලෙස සමත්වී උපාධියක් හිමිකර තිබිය යුතුයි.

**ඒ සමඟම**

(අ) උපාධියට එක් විෂයක් ලෙස සිංහල භාෂාව සමත්වූ අයදුම්කරුවන්, අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට/ ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් හිමිකර තිබිය යුතුයි නැතිනම් උපාධියට එක් විෂයක් වශයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වූ අයදුම්කරුවන්, අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් සිංහල භාෂාව හා සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුයි.

**හෝ**

(ආ) උපාධියට එක් විෂයක් ලෙස සිංහල භාෂාව සමත්වූ අයදුම්කරුවන්, අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් හිමිකර තිබිය යුතුයි එසේ නැතිනම් උපාධියට ඉංග්‍රීසි භාෂාව විෂයක් ලෙස සමත්වී ඇති අයදුම්කරුවන්, අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් සිංහල භාෂාවට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් හිමි කර තිබිය යුතුයි.

**හෝ**

(2) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්ව විද්‍යාලයකින් **භාෂා පරිවර්තන අධ්‍යාපනය** විෂය මාලාවක් ලෙස සමත් වී උපාධියක් හිමිකර තිබිය යුතුයි.

**ඒ සමඟම**

(අ) අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට/ ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් හිමි කර තිබිය යුතු අතර සිංහල භාෂාව හා සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් හිමිකර තිබිය යුතුයි.

**හෝ**

(ආ) අ.පො.ස. (උ.පෙ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට අවම වශයනේ සාමාන්‍ය සාමාර්ථයක් හිමිකර තිබිය යුතු අතර අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් සිංහල භාෂාවට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් හිමි කර තිබිය යුතුයි.

**හෝ**

(3) ශ්‍රී ලංකාවේ පෙරදිග භාෂා ප්‍රවර්ධන සංගමයේ අවසාන උපාධිය (පණ්ඩිත්) හිමිකර තිබිය යුතුයී.

**ඒ සමඟම**

(අ) අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට / ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් හිමිකර තිබිය යුතුයි.

**හෝ**

(ආ) අ.පො.ස. (උ.පෙ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට අවම වශයනේ සාමාන්‍ය සාමාර්ථයක් හිමිකර තිබිය යුතුයි.

## 06 බඳවා ගැනීමේ ක්‍රමය:-

06.1 ලිඛිත විභාගය මඟින් කුසලතා පදනම මත, බඳවා ගන්නා අවස්ථාවේදී බලගන්වන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ සැලැස්ම, ජාතික හා පළාත් ප්‍රතිපත්තීන් යන කරුණුවලට එකඟව පළාත් ආදායම් බදු සේවයට අයත් පරිවර්තක තනතුරට බඳවා ගනු ලැබේ. මෙම දැන්වීම මඟින් ඉල්ලා ඇති සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නැති බව දැනුවත් වුවහොත් මෙම තනතුර සඳහා තම අයිතිවාසිකම් අහෝසි කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සුදුසුකම්, හා ලියකියවිලි පරීක්ෂාවට ලක් කරනු ලැබේ. මෙම කටයුත්ත සඳහා ලකුණු ප්‍රදානය කරන්නේ නැත.

06.2 ඉහත සඳහන් සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන්ගෙන්, ලිඛිත විභාගයෙන් සුදුසුකම් ලබන විභාග අපේක්ෂකයන් ලබා ගත් සම්පූර්ණ ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩුවලට පත්කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයට තෝරා ගනු ලැබේ.

06.3 පුරප්පාඩු වලින් 03% විශේෂ අවශ්‍යතාවයන් (ආබාධිතයන්) ඇති අය සඳහා වෙන් කරනු ලැබේ. විභාග අපේක්ෂකයන් පත්වීම සඳහා තෝරා ගන්නා විට අදාළ තනතුරේ සේවය කිරීම සඳහා තම අබාධිත තත්වය (Disability) බාධාවක් නොවන බව වෛද්‍ය පරීක්ෂණ සහතිකය මගින් ඔප්පු කළ යුතුය. කෙසේ වුවද විශේෂ අවශ්‍යතාවයන් ඇති විභාග අපේක්ෂකයෙක් පත්වීම සඳහා සුදුසුකම් ලැබීමට නම් ලිඛිත පරීක්ෂණයේ දී ඉල්ලා ඇති ලකුණු ප්‍රමාණය ලබාගත යුතුයි.

## 07. විභාග ගාස්තුව :-

අයදුම්කරු පදිංචි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රුපියල් 500.00 ක් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** ගේ අංක **"3401"** දරණ තැන්පත් ගිණුමට බැර කරන ලද කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුව තුළ නොගැළවෙන සේ අලවා යොමු කළ යුතුයි. මොනයම් හේතුවක් නිසා හෝ මෙම ගාස්තු නැවත ගෙවනු නොලැබෙන අතර මෙම ගාස්තුව වෙන විභාගයක් සඳහා මාරු කිරීමට ද අවස්ථාව දෙනු ලබන්නේ නැත

## 08. අයදුම් කරන ආකාරය:-

08.1 මෙම දැන්වීම අවසානයේ ඇති ආදර්ශ අයදුම්පතට සරිලනසේ A4 ප්‍රමාණයේ (**සෙ.මී**21 x **සෙ.මී** 29) කඩදාසියේ 1 සිට 10 දක්වා ජේද පළමු පිටුවේ ද 11 සිට 14 දක්වා ජේද දෙවන පිටුවේ ද ඇතුළත් වන සේ අයදුම්පත සකස් කළ යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත 26.12.2018 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ, **"ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, උතුරු පළාත, අංක** :393/48, **කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය

08.2 එක් භාෂාවකට අමතරව පරිවර්තන භාෂා මාධ්‍යයට අයදුම් කිරීමට සුදුසුකම්ලත් අයදුම්කරුවන්, එක් අයදුම්පතක් පමණක් උපයෝගි කරගෙන සම්පූර්ණ කර යොමු කළ යුතු අතර මේ සඳහා විභාග ගාස්තු එක්වරක් පමණක් ගෙවීම ප්‍රමාණවත්.

08.3 අයදුම්පත යොමු කරන ලිපි කවරයේ වම් උඩ කෙළවරේ **"උතුරු පළාත් රාජ්‍ය සේවයට අයත් පළාත් භාෂා පරිවර්තන සේවයේ II වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2018"** යනුවෙන් සඳහන් කළ යුතුයි. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අවශ්‍ය තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.4 අයදුම්පතේ ඡායා පිටපත තමා වෙත තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම්පතේ ඡායා පිටපත හා පූර්ව නිශ්චිත පිටපත් යනාදී භාරගනු නොලැබේ. විභාගයට අදාල ප්‍රවේශ පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබේ. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම යනු **අපේක්ෂකයා විසින් සියළුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් සේ නොසැළකිය යුතුයි.**

08.5 අයදුම්පත් ඉදිරිපත් කරන සුදුසුකම් ඇති අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ හා සම්බන්ධ පුවත්පත් නිවේදනයක් ද නිකුත් කරනු ලැබේ. විභාග අපේක්ෂකයෙකුට දැන්වීම නිකුත් කර විභාග දිනයට අවම වශයෙන් දින තුනකට (03) පෙර හෝ විභාග ප්‍රවේශ පත්‍ර ලැබුණේ නැතිනම්, ප්‍රවේශ පත්‍ර නොලැබීම සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු සමග **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, උතුරු පළාත, අංක** 393/48, **කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුයි. (දුරකථන අංකය - 021 221 9939, දුරකථන අංකය - 021 221 9940)

**සටහන :-**

ප්‍රවේශපත්‍රය නොලැබුණු බව සඳහන් ලිපියක්, අයදුම්පත හා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ සහතික කරන ලද පිටපත, ප්‍රවේශ පත්‍රය යොමු කිරීම සඳහා ෆැක්ස් අංකයක්.

08.6 විභාගයට අයදුම් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැන්වීමක් නිකුත් කරනු නොලැබේ. එමෙන්ම අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ප්‍රථම ඉල්ලා ඇති සුදුසකම් පූර්ණය කරනු නොලබන අයදුම්කරුවන්ගේ අයදුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඒ සඳහා කිසිදු දැන්වීමක් නිකුත් කරනු නොලැබේ.

## 09. අනන්‍යතාවය ඔප්පු කිරීම :-

අපේක්ෂකයන් තමා පෙනී සිටින සෑම විෂයයන් සම්බන්ධයෙන්ම අධීක්ෂණ නිලධාරියා සෑහීමකට පත්වන ආකාරයකට ඔබගේ අනන්‍යතාවය ඔප්පු කළ යුතුයි. අනන්‍යතාවය ඔප්පු කිරීමට පහත සඳහන් ලේඛනවලින් ඉදිරිපත් කරන ඕනෑම ලේඛනයක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කරන ලද ජාතික හැඳුනුම්පත් අංකය
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලේඛනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත්වන විභාග අපේක්ෂකයෙකුගේ විභාගයට පෙනී සිටීමේ හිමිකම **පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත් ලේකම්**, විසින් අහෝසි කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් නැඹුරු විය යුතුයි. එම නීතිරීති උල්ලංඝනය කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන දඬුවම්වලට යටත් වීමට සිදුවන බව දන්වා සිටිනු ලැබේ.

## 10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්

අයදුම්පත් සම්පූර්ණ කරන විට ඉතාමත්ම අවධානයෙන් යුතුව සත්‍ය තොරතුරු ඇතුළත් කළ යුතුයි. මෙම විභාග රෙගුලාසින් ප්‍රකාර යම්කිසි අයදුම්කරුවෙකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී හෝ විභාගයෙන් පසුව හෝ අපේක්ෂකයාට සුදුසුකම් නැති බව අනාවරණය වන අවස්ථාවක් වෙතොත් එම අවස්ථාවේදීම අපේක්ෂකයාගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන කිසියම් තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන අවස්ථාවකදී පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබේ.

## 11. අත්සන සහතික කිරීම :-

**සෑම අපේක්ෂයෙක්ම තම අත්සන සහතික කිරීම අත්‍යාවශ්‍යයි.** රජයේ ආයතනයක් මගින් අයදුම් කරන අපේක්ෂකයෙක් තම ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු මගින් සහතික කර ගත යුතුයි. අනෙක් අයදුම්කරුවන් තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි, සාම විනිසුරු, දිවුරුම් නිලධාරි, නීතිඥ, නොතාරිස්, නාවික හමුදා, යුදහමුදා, ගුවන් හමුදා යනාදියේ අණ ලැබූ නිලධාරියෙකු, රුපියල් 395,520.00 ට නොඅඩු වටිනාකමින් යුත් වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර රජයේ හෝ පළාත් පාලන හෝ පළාත් නිලධාරියෙකු, ආගමික නිකායන් භාරව සිටින ආගමික නායකයන් යන අයගෙන් කෙනෙකු ස්ථිර කළ යුතුයි.

## 12. විභාග සැලැස්ම :-

මෙම ලිඛිත විභාගය පහත සඳහන් කර ඇති පරිදි **ප්‍රශ්න පත්‍ර හතරකින් (04)** සමන්විත වන අතර. මෙම විභාගය ඕනෑම පරිවර්තන භාෂා මාධ්‍යය ප්‍රකාර පැවැත්වීමට නියමිතය. මෙම ලිඛිත විභාගයට පෙනී සිටින ඕනෑම විභාග අපේක්ෂකයෙක් නැවත නිවැරදි කිරීම් කටයුතු සඳහා විධිවිධාන යොදා නැත.

### 12.1 බඳවා ගැනීමේ විභාගයට අදාළ විෂයන් :- (II වන වගුව)

| පරිවර්තන භාෂා මාධ්‍යය | ප්‍රශ්න පත්‍ර | කාලය | සම්පූර්ණ ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| **භාෂා පරිවර්තක(දෙමළ - ඉංග්‍රීසි)** | 1. පරිවර්තනය - දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට | පැය 03 | 100 | 40 |
| | 2. පරිවර්තනය - ඉංග්‍රීසි භාෂාවෙන් දෙමළ භාෂාවට | පැය 03 | 100 | 40 |
| | 3. දෙමළ භාෂාව | පැය 1 1/2 | 100 | 40 |
| | 4. ඉංග්‍රීසි භාෂාව | පැය 1 1/2 | 100 | 40 |
| **භාෂා පරිවර්තක(දෙමළ - සිංහල)** | 1.පරිවර්තනය - දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවට | පැය 03 | 100 | 40 |
| | 2.පරිවර්තනය - සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවට | පැය 03 | 100 | 40 |
| | 3.දෙමළ භාෂාව | පැය 1 1/2 | 100 | 40 |
| | 4.සිංහල භාෂාව | පැය 1 1/2 | 100 | 40 |

| | | | | |
|---|---|---|---|---|
| **භාෂා පරිවර්තක (සිංහල - ඉංග්‍රීසි)** | 1.පරිවර්තනය - සිංහල භාෂවෙන් ඉංග්‍රීසි භාෂාවට | පැය 03 | 100 | 40 |
| | 2.පරිවර්තනය - ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවට | පැය 03 | 100 | 40 |
| | 3.සිංහල භාෂාව | පැය 1 1/2 | 100 | 40 |
| | 4.ඉංග්‍රීසි භාෂාව | පැය 1 1/2 | 100 | 40 |

**12.2 විෂයන්ට අදාළ විෂය ක්ෂේත්‍රය :- (III වන වගුව)**

| පරිවර්තන භාෂා මාධ්‍යය | ප්‍රශ්න පත්‍ර | විෂය ක්ෂේත්‍රය |
|---|---|---|
| **භාෂා පරිවර්තක - දෙමළ- ඉංග්‍රීසි** | 1. පරිවර්තනය- දෙමළ භාෂවෙන් ඉංග්‍රීසි භාෂාවට | පරිපාලනය, නීති, විද්‍යාව, තාක්ෂණ, කලා, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරා ගන්නා ලද ඡේද තුනක් (03) දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට පරිවර්ථනය කිරීම. |
| | 2. පරිවර්තනය- ඉංග්‍රීසි භාෂාවෙන් දෙමළ භාෂාවට | පරිපාලනය, නීති, විද්‍යාව, තාක්ෂණ, කලා, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරා ගන්නා ලද ඡේද තුනක් (03) ඉංග්‍රීසි භාෂාවෙන් දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම. |
| | 3. දෙමළ භාෂාව | රචනා ලිවීම, සාරාංශය ලිවීම, ඉදිරිපත් කරන ඡේදයක් කෙටියෙන් තම වචනවලින් දැක්වීම, වචනවල අර්ථය පැහැදිලි වන ආකාරයට වාක්‍ය සකස් කිරීම, වාක්‍යවලින් ව්‍යාකරණ දෝෂ නිවැරදි කිරීම, කතාබස් කිරීමේ විලාශය පැහැදිලි කිරීම, අක්ෂර වින්‍යාශය. |
| | 4. ඉංග්‍රීසි භාෂාව | රචනා ලිවීම, ඉදිරිපත් කරන වචන උපයෝගි කරගෙන අර්ථය පැහැදිලි වනසේ වාක්‍ය තැනීම, කතාබස් කිරීමේ විලාශය පැහැදිලි කිරීම්, එක්ව තිබෙන හා තනි වාක්‍ය විශ්ලේෂණය කිරීම. |
| **භාෂා පරිවර්තක (දෙමළ -සිංහල)** | 1. පරිවර්තනය.- සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවට | පරිපාලනය, නීති, විද්‍යාව, තාක්ෂණ, කලා, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරා ගන්නා ලද ඡේද තුනක් (03) සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම. |
| | 2. පරිවර්තනය - දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවට | පරිපාලනය, නීති, විද්‍යාව, තාක්ෂණ, කලා, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරා ගන්නා ලද ඡේද තුනක් (03) දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවට පරිවර්තනය කිරීම. |
| | 3. සිංහල භාෂාව | රචනා ලිවීම, සාරාංශය ලිවීම, ඉදිරිපත් කරන ඡේදයක් කෙටියෙන් තම වචනවලින් දැක්වීම, වචනවල අර්ථය පැහැදිලි වන ආකාරයට වාක්‍ය සකස් කිරීම, වාක්‍යවලින් ව්‍යාකරණ දෝෂ නිවැරදි කිරීම, කතාබස් කිරීමේ විලාශය පැහැදිලි කිරීම, අක්ෂර වින්‍යාශය. |
| | 4. දෙමළ භාෂාව | රචනා ලිවීම, ඉදිරිපත් කරන වචන උපයෝගි කරගෙන අර්ථය පැහැදිලි වනසේ වාක්‍ය තැනීම, කතාබස් කිරීමේ විලාශය පැහැදිලි කිරීම්, එක්ව තිබෙන හා තනි වාක්‍ය විශ්ලේෂණය කිරීම. |
| **භාෂා පරිවර්තක (සිංහල - ඉංග්‍රීසි)** | 1. පරිවර්තනය- සිංහල භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට | පරිපාලනය, නීති, විද්‍යාව, තාක්ෂණ, කලා, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරා ගන්නා ලද ඡේද තුනක් (03) සිංහල භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තන කිරීම. |
| | 2. පරිවර්තනය.- ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවට | පරිපාලනය, නීති, විද්‍යාව, තාක්ෂණ, කලා, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරා ගන්නා ලද ඡේද තුනක් (03) ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවට පරිවර්තනය කිරීම. |

| | | |
|---|---|---|
| | 3. සිංහල භාෂාව | රචනා ලිවීම, සාරාංශය ලිවීම, ඉදිරිපත් කරන ඡේදයක් කෙටියෙන් තම වචනවලින් දැක්වීම, වචනවල අර්ථය පැහැදිලි වන ආකාරයට වාක්‍ය සකස් කිරීම, වාක්‍යවලින් ව්‍යාකරණ දෝෂ නිවැරදි කිරීම, කතාබස් කිරීමේ චාරිත්‍රය පැහැදිලි කිරීම, අක්ෂර වින්‍යාශය. |
| | 4. ඉංග්‍රිසි භාෂාව | රචනා ලිවීම, ඉදිරිපත් කරන වචන උපයෝගි කරගෙන අර්ථය පැහැදිලි වනසේ වාක්‍ය තැනීම, කතාබස් කිරීමේ විලාශය පැහැදිලි කිරීම්, එක්ව තිබෙන හා තනි වාක්‍ය විශ්ලේෂණය කිරීම. |

**සටහන්** :-

මෙම විභාගය එක් තරඟ විභාගයක් වන බැවින් සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබීමට එක් එක් ප්‍රශ්න පත්‍රයකටම වෙන්කරන ලද ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් සියයට හතලිහක් (40%) ලබාගත යුතුයි.. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් මෙම තරඟ විභාගයෙන් ලබාගත් මුළු ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙළ (Merit Order) සැලකිල්ලට ගනු ලැබේ.

13. විභාග අපේක්ෂකයන්ට අදාල විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් www.np.gov.lk යන උතුරු පළාත් අන්තර්ජාලය මගින් නිකුත් කරනු ලැබේ. ඉන් අනතුරුව විභාගයට පෙනී සිටි සෑම අපේක්ෂකයෙකුටම වෙන වෙනම තැපැල් මගින් නිකුත් කරනු ලැබේ.

14. මෙම විභාගය පැවැත්වීමට හෝ අවලංගු කිරීමට උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්තුමාට බලය ඇත. දෙමළ හා සිංහල මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනුකූලතාවයන් අතර වෙනසක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

15. මෙම විභාගය සම්බන්ධ නිවේදනය www.np.gov.lk යන උතුරු පළාත් වෙබ් අඩවියට පිවිසීමෙන් බලා ගත හැකිය.

***අ. සිවපාලසුන්දරන්,***
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
26.11.2018